දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ ඉල් පුර තියවක ලත් කුජ දින | කාණ්ඩය 111 | පත්‍රය 286 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 17 අඟහරුවාදා

කොවිඩ් ව්‍යාප්තිය



සතියේ තුනපත මඩිස්සලේ බද්දරමල්ල අද පත්‍රය සමඟ

කල්ලාරු රක්ෂිතය පෞද්ගලික වියදමින් නැවත වගා කරනු

අභියාචනාධිකරණය බදියුදීන්ට නියෝග කරයි

නෙල්කා මැදගෙදර

රෂාඩ් බදියුදීන් මහතා එවකට අමාත්‍ය ධුරයේ කටයුතු කරමින් සිටියදී විල්පත්තු රක්ෂිත වනාන්තර කලාපය ආසන්නයේ පිහිටි කල්ලාරු රක්ෂිතය එළිපෙහෙළි කොට අනවසර ජනාවාස ඉදිකිරීමෙන් නීති විරෝධී ක්‍රියාවක් සිදුකොට ඇතැයි ඊයේ (16) තීන්දු කළ අභියාචනාධිකරණය ඔහුගේ පෞද්ගලික වියදමින් ඊට සමාන වපසරියකින් යුත් ප්‍රදේශයක වන වගා වැඩසටහනක් ක්‍රියාවට නංවන්නැයි නියෝග කළේය.

පිට 06

සංචාරක රියැදුරන්ට දෙන රු 15000 දීමනාව මේ සතියේ ගෙවා අවසන් කරන්න

ඇමැති ප්‍රසන්නගෙන් නිලධාරීන්ට උපදෙස්

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් සංචාරක රියැදුරන් 3,085 දෙනකු සඳහා රජය මගින් ලබාදීමට නියමිත රුපියල් 15,000ක දීමනාව මේ සතිය ඇතුළත ගෙවා අවසන් කරන ලෙස සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ධම්මිකා විජේසිංහ මහත්මියට ඊයේ (16) උපදෙස් දුන්නේය.

සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි රියැදුරන්ට රුපියල් 15,000 බැගින් වූ දීමනාවක් ගෙවීමට කැබිනට් අනුමැතිය හිමිව ඇති අතර, මෙම දීමනාව වෙනුවෙන් රුපියල් ලක්ෂ 462.75ක මුදලක් රජය වෙන්කර තිබේ.

පිට 06

අය පාර්ලි

CLICK

...ණික

...ද අලුත්ගෙදර

...කාළඹ නැගෙනහිර මූලික රෝහලේ පී.සී.ආර් යන්ත්‍රයේ තාක්ෂණික දෝෂයක් නොමැති බව ...කාවේ චීන තානාපති කාර්යාලය පවසයි.

පිට 06

විශේෂ කැබිනට් රැස්වීමක් අද

ධනුෂ්ක ගොඩකුඹුර

අ-වැය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන විශේෂ කැබිනට් රැස්වීමක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී අද (17) උදෑසන 10.00ට පැවැත්වේ.

පිට 06

පක්ෂ භේද නොසලකා කොරෝනා මඬින්න එක් වෙමු

ශිරෝමි අබයසිංහ

කොරෝනා වසංගතයෙන් රටත් ජනතාවත් ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශ්ව දේශපාලන භේද පසෙකලා එකට එක්වීය යුතු බවට එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා පැවසීය.

පිට 06

සාමාන්‍ය පෙළ විභාගය ජන. 18 සිට 27 දක්වා

පිට 06

කොවිඩ් දෙවන රැල්ලේ ආරම්භයත් සමඟ මේ දක්වා වැඩිම ආසාදිතයන් සංඛ්‍යාව කොළඹින්

පිට 02

ශිෂ්‍යත්වයෙන් සිසුහු 10ක් ලකුණු 200 ලබා ගනිති

සිතාරා සේනානි

ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු වරට පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ උපරිම ලකුණු සංඛ්‍යාව වන ලකුණු 200ම ගැනීමට සිසු සිසුවියෝ දස දෙනෙක් සමත්ව සිටිති.

පිට 06

පාස්කු ඉරිදා ප්‍රහාරය

දෙහිවලදී අත්අඩංගුවට ගත් සැකකරුවකුගේ නිවෙසට බදියුදීන්-මොහොමඩ් හලීම් කිහිප වරක් ගිහිල්ලා

ජනපති කොමිසම හමුවේ අනාවරණය වෙයි

පිට 06

බන්ධනාගාරවලින් නිදහස් වන පුද්ගලයන් දින14ක් නිරෝධායනයට

බුද්ධිකා ඉඹුලාන

බන්ධනාගාරවලින් නිදහස ලබා පිටව යන සියලුම පුද්ගලයන් මින් ඉදිරියට අනිවාර්යයෙන් දින 14ක කාලයක් නිරෝධායනයට යොමු කිරීමට තීරණය කර තිබේ.

පිට 06

...ණය කාඩ්පත්වලට ගෙවීමට තිබෙන මුදල මිලියන 3,389කින් මහ - අඩු වෙලා

ශ්‍රී ලංකාවේ ගුවන් නියමුවරියන් දෙදෙනෙක්

පිට 06

අලුත් රැඳවූවන් වෙනම තැනකට

බුද්ධිකා ඉඹුලාන

කොළඹ හා තදාසන්න පෙදෙස්හි